Since 1956

Alliance Finance Co. PLC

Built on Trust. Powered by Innovation.

# එලායන්ස් ෆිනෑන්ස් කොම්පැණි පීල්සි

## සෞභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

**අරමුණු ප්‍රකාශය**

# "තිරසාර මූල්‍යකරණය තුළින් වඩාත් හිතකර ලොවක් "

ප්‍රධාන කරුණු ලේඛණය

ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීම් ගිණුම් හා ක්ෂණික මූල්‍ය ණය පහසුකම්

PEOPLE • PLANET • PROFIT

Sri Lanka's pioneering triple bottom line financial institution

Since 1956

Alliance Finance Co. PLC

Built on Trust. Powered by Innovation.

**හැඳින්වීම**

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැණි පීඑල්සී (ඒඑෆ්සී) කොළඹ කොටස් වෙළඳපොලෙහි නම් කරන ලද සමාගමක් වන අතර එය 2011අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වී ඇත. 1956 වසරේ පිහිටුවන ලද අප මූල්‍ය සමාගම ශ්‍රී ලංකාවේ පවතින තෙවැනි පැරණිම මූල්‍ය සමාගම වීම අපට මහත් අභිමානයකි. එමෙන්ම එකී දශක හය තුළ අප දියුණුවට පත්වූයේ අපගේ පරම්පරා හතරක ලෙන්ගතු සේවාදායකයන් වෙත පුළුල් මූල්‍ය සේවා රැසක් ලබාදීමෙනි. එම කාල වකවානුව තුළ අපේ සේවාදායකයන් ඔවුන්ගේ දෘඩි විශ්වාසය අප වෙත තබා ඇත.

ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීමේ ගිණුම්, කල්බදු, ක්ෂුද්‍ර ණය පහසුකම්, රන් ණය, ඔඩපන ණය, ක්ෂණික මූල්‍ය ණය, සංවර්ධන මූල්‍ය පහසුකම්, වාහන කුලියට දීම හා අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලය මගින් පෙළ ගස්වනු ලබන අනෙකුත් උප සේවාවන් මෙන්ම ප්‍රවාහන විසඳුම් ආදී මූල්‍ය සේවා රාශියක් සේවාදායකයන් වෙත ලබා දීමට සමාගම සමත්වී ඇත.

පසුගිය වසර හැටකට අධික කාල පරිච්ඡේදය තුළ අපගේ මූලික අරමුණ වූයේ සේවාදායක තෘප්තිය වූ අතර අපගේ කාර්ය මණ්ඩලය ද සෑම විටම විශිෂ්ට සේවාවක් ලබා දීම ඔවුන්ගේ භූමිකාව බව සැදී පැහැදී සේවය කර ඇත.

ඔබ සැමට අපගේ කාර්යාලය වෙත පැමිණ අපගේ අද්විතීය අප්‍රමාදී මිත්‍රශීලී මෙන්ම පුද්ගලිකත්ව සේවාවන් අත්විඳින මෙන් ඔබට ඇරයුම් කෙරෙන අතර සතියේ දිනවල පෙ.ව. 8.00සිට ප.ව. 4.30දක්වා ද සෙනසුරාදා දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා අපගේ කාර්යාල ඔබ වෙනුවෙන් විවෘතව තබා ඇත. එමෙන්ම, අපගේ වටිනා තැන්පත්කරුවන් සඳහාම ඔවුන්ගේ අවශ්‍යතා අනුව ඵලදායී සේවාවක් ඉතා ඉක්මනින්ම ලබා දීමට අප ඇප කැප වී සිටින්නෙමු. ඔබට වඩාත් හොඳ සේවාවක් ලබා දීමට මෙයද අවස්ථාවක් වනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

එලායන්ස් ෆිනෑන්ස් ISO 9001:2015, ISO 22301:2012 ප්‍රමිති සහතික ලත් සමාගමක් වන අතර Lanka Rating Agency විසින් සමාගමට [SL] BBB - with stable outlook ණය ශ්‍රේණිය ලබාදී ඇත.

ප්‍රධාන තොරතුරු ලේඛණය - ස්ථාවර තැන්පතු

<table>
<tr><td>ගිණුම් විස්තරය</td><td colspan="3">තරඟකාරි ප්‍රතිලාභයන්ගෙන් සමන්විත අපගේ ස්ථාවර තැන්පතු ඔබගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා වූ පූර්ණ ආයෝජනයකි. මාස 01 සිට මාස 60 දක්වා වූ කාල පරාසයෙන් ඔබට යෝග්‍යතම කාලවකවානුව ඔබට තෝරාගත හැකි අතර ඒ සඳහා පොළිය මාසිකව, කාර්තුමය, අර්ධ වාර්ෂිකව, වාර්ෂිකව හෝ කල්පිරීමේදී ලබා ගැනීමේ විකල්පද තෝරාගත හැකිය. ඔබ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් නම් (වයස අවුරුදු 60ට වැඩි) ඉහළ පොලී අනුපාතයක් ලැබීමටද ඔබට සුදුසුකම් ලැබේ.</td></tr>
<tr><th>ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රතිලාභ</th><th>ගාස්තු/වියදම් විස්තර</th><th>ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍ය ලියවිලි හා ක්‍රියාවලිය</th><th>ප්‍රධාන නියමයන් හා කොන්දේසි</th></tr>
<tr>
<td>• අදාළ ස්වභාවය අනුව පොළී අනුපාත මාස 1,3,6,9,12,15,18, 24,30,36,48 සහ 60 යනාදී කාල වකවානු වලට ලබාගත හැකිය.<br>• ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හට මාස 12හා ඊට වැඩි කාලයක් සඳහා අමතර 0.5% වාර්ෂික පොලියකට හිමිකම් හිමිවේ .<br>• ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පත් කරුවන්ට දොරකඩට පැමිණ සේවය සැපයීම.<br>• ශල්‍ය හා රෝහල් ගාස්තු හා වෙනත් හදිසි වුවමනාවන් සඳහා ක්ෂණික මූල්‍ය ණය පහසුකම්.<br>• ස්ථාවර තැන්පතු වල පොළිය ස්වයංක්‍රීයව ඔබේ AFC ඉතිරි කිරීම් ගිණුමට මාරු කර ගැනීම හෝ ක්ෂණික මූල්‍ය</td>
<td>නවතම පොළී අනුපාත සඳහා AFC වෙබ් අඩවියට පිවිසෙන්න. www.alliancefinance.lk<br><br>ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ, වසා දැමීමේ ගාස්තු නැත.</td>
<td>පුද්ගලික තැන්පතු සඳහා<br>• නියමිත ආකාරයට පුරවා සම්පූර්ණ කළ ස්ථිර තැන්පතු අයදුම්පත<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ පාරිභෝගික ආකෘතිය<br>• ජා.හැ.ප/රියදුරු බලපත්‍රය/විදේශ ගමන් බලපත්‍රය<br>• නවතම බිල්පත් සාක්ෂිය (මාස 03ක් ඇතුළත)<br>• රැඳවුම් බදු ප්‍රකාශය (අදාළ නම්)<br>( පොලිය මත අයකරන බදු දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ)<br><br>පදිංචි ලිපිනය ජා.හැ. පතෙන් හෝ රියදුරු බලපත්‍රයෙන් වෙනස් වූ විට ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br><br>උපයෝගිතා බිල්පත් සඳහා උදාහරණ</td>
<td>යෝග්‍යතා නිර්නායක<br>• වලංගු ජාතික හැඳුනුම්පතක්/රියදුරු බලපත්‍රයක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 60කට වැඩි ඕනෑම ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්.<br>• ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු යනු තැන්පතුව බාර ගැනීමේදී හෝ අලුත් කිරීමේදී වයස අවුරුදු 60 කට වැඩි පුද්ගලයෙකි.<br>• බද්ධ තැන්පතු සඳහා අමතර වාර්ෂික පොලිය ලබා ගැනීම සඳහා සඳහා සියළුම ගිණුම් හිමියන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විය යුතුය.<br>• අවම තැන්පතුව රු. 5000ක් විය යුතුය.<br>• අළුත් කිරීමේ දැන්වීම මසකට පෙර සේවාදායකයා වෙත එවනු ලබන අතර සියළු ආපසු ගැනීම් සඳහා නියමිත ආකාරයෙන් පිටසන් කළ මුල් ස්ථාවර තැන්පතු සහතිකය ඉදිරිපත් කිරීමෙන්</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| ණය පොලී මුදල් අය කරවා ගැනීම කළ හැකිය.<br>• පුද්ගලික සේවා<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති බැවින් එක් තැන්පත් කරුවෙකුට උපරිම රු. 1,100,000/- වන්දියක් ලබා ගැනීමේ හැකියාව ඇත | | - (විදුලි බිල්පත, ජල බිල්පත, ස්ථාවර දුරකථන බිල්පත)<br><br>තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි වෙනත් ලේඛණ - බැංකු ප්‍රකාශ, කුලී ගිවිසුම්, රාජ්‍ය අධිකාරියකින් ගත් ලිපි, රැකියා ගිවිසුම්. | කළ හැකිය.<br>• කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමකදී, ගෙවිය යුතු පොළිය අඩු පොලී අනුපාතයක් මත ගණනය කරනු ලබන අතර මාසික පොළී ගෙවන තැන්පතු සම්බන්ධයෙන් වැඩිපුර ගෙවූ ඕනෑම පොළියක් තැන්පතු මූලික මුදලින් (ප්‍රාග්ධනයෙන්) අයකර ගනු ලැබේ.<br><br>• ස්ථාවර තැන්පතුව විවෘත කිරීමෙන් දින 30කට ප්‍රථම මුදල් ආපසු ලබාගන්නේ නම් ( විවෘත කළ දිනය හා ආපසු ගැනීමේ දිනය හැර) තැන්පත්කරුට කිසිඳු පොළියක් නොගෙවනු ලැබේ.<br><br>• වීසා ලිපි හා ශේෂ තහවුරු ලිපි ගිණුම් හිමියාගේ ඉල්ලීම මත නොමිලේ නිකුත් කරනු ලැබේ.<br><br>• මූලික ස්ථාවර තැන්පතු අයදුම්පතේ සඳහන් නම්කළ තැනැත්තා ගිණුම් හිමියාගේ ලිඛිත උපදෙස් මත පමණක් වෙනස් කළ හැක.<br><br>• සහතිකයක් නැතිවූ විටක, සතුටුදායක පැහැදිලි කිරීමක් සහ ගිණුම් හිමියාගෙන් ලබාගන්නා දිවුරුම් ප්‍රකාශයක් මත නව සහතිකයක් නිකුත් කෙරේ. (සහතික කළ යුතු වන්නේ සාම විනිසුරු හෝ නීතීඥ) |

| | | | |
|---|---|---|---|
| | | | • උදාසීන ගිණුම් ප්‍රතිපත්තිය උදාසීන/අත්හරින ලද ස්ථාවර තැන්පතු ගිණුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුමත කරන ලද නීති ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ. ගිණුමක් කිසිඳු මූල්‍ය ක්‍රියාකාරකමක් නොමැති නම් හෝ වසර 10කට හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව තැන්පතු හිමියෙකුගෙන් ලිඛිත සන්නිවේදනයක් නොලැබුනේ නම්, එම ගිණුම ''අක්‍රීය ගිණුමක්'' සේ සලකනු ලබන අතර තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දන්වනු ලබයි.<br>• වෙනත් නියමයන් හා කොන්දේසි සඳහා තැන්පතු අයදුම්පතේ පිටපැත්ත බලන්න. |

| ජ්‍යෙෂ්ඨ පුරවැසියන් නොවන හා සංස්ථාපිත සේවාග්‍රාහකයින්ගේ ප්‍රතිලාභ | කුලී/ගාස්තු විස්තර | ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍ය ලියවිලි හා ක්‍රියාවලිය | ප්‍රධාන නියමයන් හා කොන්දේසි |
|---|---|---|---|
| • අදාළ ස්වභාවය අනුව පොළී අනුපාත මාස 1,3,6,9,12,15,18, 24,30,36,48 සහ 60 යනාදී කාල වකවානු වලට ලබාගත හැකිය.<br>• දොරකඩට පැමිණ සේවය සැපයීම.<br>• හදිසි මුදල් අවශ්‍යතා සඳහා ක්ෂණික මූල්‍ය ණය පහසුකම් (ඔබේ ආයෝජනයෙන් 75% සිට 90% දක්වා අනුමත කිරීමක් මත)<br>• ස්ථිර ගිණුම් සඳහා වූ පොළිය ඔබේ AFC ගිණුමට හෝ ක්ෂණික මූල්‍ය ණය පහසුකමට ස්වයංක්‍රියව මාරු කරගත හැකිය.<br>• පුද්ගලික සේවය<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති බැවින් එක් තැන්පත් කරුවෙකුට උපරිම රු. 1,100,000/- වන්දියක් ලබා ගැනීමේ හැකියාව ඇත | නවතම පොළී අනුපාත සඳහා AFC වෙබ් අඩවියට පිවිසෙන්න. www.alliancefinance.lk<br><br>ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ, වසා දැමීමේ ගාස්තු නැත. | **පුද්ගලික තැන්පතු සඳහා**<br>• නියමිත ආකාරයට පුරවා සම්පූර්ණ කළ ස්ථිර තැන්පතු අයදුම්පත<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ පාරිභෝගික ආකෘතිය<br>• ජා.හැ.ප/රියදුරු බලපත්‍රය/විදේශ ගමන් බලපත්‍රය<br>• නවතම බිල්පත් සාක්ෂිය (මාස 03ක් ඇතුළත)<br>• රැඳවුම් බදු ප්‍රකාශය (අදාළ නම්)<br>( පොලිය මත අයකරන බදු දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ)<br>**සංස්ථාපිත ගිණුම් සඳහා**<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ ස්ථාවර තැන්පතු අයදුම්පත<br>• නියමිත ලෙස පිරවූ KYC පෝරමය<br>• ව්‍යාපාර ලියාපදිංචිය<br>• සමාගම් ව්‍යවස්ථාව<br>• බලයලත් අත්සන්කරුවන්ගේ ලිපිය<br>• 20,40 සහ 15 පෝරම<br>• අධ්‍යක්ෂ මණ්ඩල සම්මතය<br>• KYC පෝරමය (අර්ථදායි අයිතිකරුවන් සඳහා)<br>• භාරකාර ඔප්පු<br>• අධ්‍යක්ෂවරුන්ගේ ජා.හැ.පත් වල පිටපත්<br>පදිංචි ලිපිනය ජා.හැ. පතෙන් හෝ රියදුරු බලපත්‍රයෙන් වෙනස් වූ විට<br><br>ලිපින සත්‍යාපනය සඳහා ලේඛණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | **යෝග්‍යතා නිර්ණායක**<br>• වලංගු ජාතික හැඳුනුම්පතක්/රියදුරු බලපත්‍රයක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18ට වැඩි ඕනෑම ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්.<br>• වලංගු ලියාපදිංචි ලියවිල්ලක් හිමි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් වීම.<br>• අවම තැන්පතුව රු. 5,000ක් විය යුතුය.<br>• සෑම මුදල් ආපසු ගැනීමකදීම වැඩ කරන දින දින 3 ට පෙර සමාගමට දන්විය යුතුය.<br>• කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමකදී, ගෙවිය යුතු පොලිය අඩු පොලී අනුපාතයක් මත ගණනය කරනු ලබන අතර මාසික පොළී ගෙවන තැන්පතු සම්බන්ධයෙන් වැඩිපුර ගෙවූ ඕනෑම පොලියක් තැන්පතු මූලික මුදලින් (ප්‍රාග්ධනයෙන්) අයකර ගනු ලැබේ.<br>• ස්ථාවර තැන්පතුව විවෘත කිරීමෙන් දින 30කට ප්‍රථම මුදල් ආපසු ලබාගන්නේ නම් ( විවෘත කළ දිනය හා ආපසු ගැනීමේ දිනය හැර) තැන්පත්කරුට කිසිඳු පොලියක් නොගෙවනු ලැබේ.<br>• වීසා ලිපි හා ශේෂ තහවුරු ලිපි |

| | | | |
|---|---|---|---|
| | | උපයෝගිතා බිල්පත් සඳහා උදාහරණ - (විදුලි බිල්පත, ජල බිල්පත, ස්ථාවර දුරකථන බිල්පත)<br><br>තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි වෙනත් ලේඛණ - බැංකු ප්‍රකාශ, කුලී ගිවිසුම්, රාජ්‍ය අධිකාරියකින් ගත් ලිපි, රැකියා ගිවිසුම්. | ගිණුම් හිමියාගේ ඉල්ලීම මත නොමිලේ නිකුත් කරනු ලැබේ.<br><br>• මූලික ස්ථාවර තැන්පතු අයදුම්පතේ සඳහන් නම්කළ තැනැත්තා ගිණුම් හිමියාගේ ලිඛිත උපදෙස් මත පමණක් වෙනස් කළ හැක.<br><br>• සහතිකයක් නැතිවූ විටක, සතුටුදායක පැහැදිලි කිරීමක් සහ ගිණුම් හිමියාගෙන් ලබාගන්නා දිවුරුම් ප්‍රකාශයක් මත නව සහතිකයක් නිකුත් කෙරේ. (සහතික කළ යුතු වන්නේ සාම විනිසුරු හෝ නීතිඥ)<br><br>• උදාසීන ගිණුම් ප්‍රතිපත්තිය උදාසීන/අත්හරින ලද ස්ථාවර තැන්පතු ගිණුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුමත කරන ලද නීති ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ. ගිණුමක් කිසිඳු මූල්‍ය ක්‍රියාකාරකමක් නොමැති නම් හෝ වසර 10කට හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව තැන්පතු හිමියෙකුගෙන් ලිඛිත සන්නිවේදනයක් නොලැබුනේ නම්, එම ගිණුම ''අක්‍රීය ගිණුමක්'' සේ සලකනු ලබන අතර තවද ශ්‍රී ලංකා මහ |

| | | | |
|---|---|---|---|
| | | | බැංකුවේ 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දන්වනු ලබයි.<br>• වෙනත් නියමයන් හා කොන්දේසි සඳහා තැන්පතු අයදුම්පතේ පිටපැත්ත බලන්න. |

ප්‍රධාන තොරතුරු ලේඛණය - ඉතිරි කිරීමේ ගිණුම් (සාමාන්‍ය ඉතුරුම්/ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම්/ත්‍රිරෝද රථ ඉතුරුම්/දිරිය කත ඉතුරුම්)

| ගිණුම් විස්තරය | ඔබේ ඉතිරි කිරීම් කැමති අවස්ථාවක ආපසු ලබා ගත හැකි වැඩි පොළියක් ඉපැයීමටද හැකියාවක් ඇති අගනා ඉතිරි කිරීමේ ක්‍රමයකි. එලායනස් ෆිනෑන්ස් සේවාදායකයන් හට ඔවුන්ගේ ඉතිරි කිරීම් ස්වයංක්‍රීයව වර්ධනය කර ගැනීම සඳහා ස්ථාවර ගිණුම් හා ඉතිරි කිරීමේ ගිණුම් හාකර ගැනීමේ අවස්ථාවක් සලසා දෙමින් ස්ථාවර ගිණුමේ මාසික පොළිය ස්වයංක්‍රීයව ඔබේ ඉතිරි කිරීම් ගිණුමට බැර කිරීමට අවස්ථාව සලසා ඇත. | | |
|---|---|---|---|
| **සේවාදායකයන්ට ප්‍රතිලාභ** | **කුලී/ගාස්තු විස්තර** | **ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍යලියවිලි හා ක්‍රියාවලිය** | **ප්‍රධාන නියමයන් හා කොන්දේසි** |
| • පොළිය දිනපතා ශේෂයට ගණනය කරන අර එය මාසිකව ඉතිරි කිරීම් ගිණුමට බැර කෙරෙනු ඇත.<br><br>• පොලී අනුපාතයෙහි අඩුවීමකින් තොරව මුදල් කැමති ප්‍රමාණයක් ආපසු ගැනීමට හැකිවීම.<br><br>• ස්ථාවර නියෝග පහසුකම.<br><br>• පහසු මුදල් තැන්පත් කිරීම්/ආපසු ගැනීම්/ මුදල් හුවමාරු කිරීම.<br><br>• පුද්ගලික සේවය<br><br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති බැවින් එක් තැන්පත් කරුවෙකුට උපරිම රු. 1,100,000/- වන්දියක් ලබා ගැනීමේ | නවතම පොළී අනුපාත සඳහා AFC වෙබ් අඩවියට පිවිසෙන්න. www.alliancefinance.lk<br><br>ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ, වසාදැමීමේ ගාස්තු නැත.<br><br>ස්ථාවර නියෝග පහසුකම සඳහා ගාස්තු අය නොකෙරේ. | **පුද්ගලික තැන්පතු සඳහා**<br>• නියමිත ආකාරයට පුරවා සම්පූර්ණ කළ ඉතිරි කිරීම් අයදුම්පත හා අත්සන් පත<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ පාරිභෝගික ආකෘතිය<br>• ජා.හැ.ප/රියදුරු බලපත්‍රය/විදේශ ගමන් බලපත්‍රය<br>• නවතම බිල්පත් සාක්ෂිය (මාස 03ක් ඇතුළත)<br>• රඳවුම් බදු ප්‍රකාශය (අදාළ නම්) ( පොලිය මත අයකරන බදු දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ)<br><br>**සංස්ථාපිත ගිණුම් සඳහා**<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ ඉතිරි කිරීම් අයදුම්පත හා අත්සන් පත<br>• නියමිත ලෙස පිරවූ KYC පෝරමය<br>• ව්‍යාපාර ලියාපදිංචිය<br>• සමාගම් ව්‍යවස්ථාව<br>• බලයලත් අත්සන්කරුවන්ගේ ලිපිය<br>• 20,40 සහ 15 පෝරම<br>• අධ්‍යක්ෂ මණ්ඩල සම්මතය<br>• KYC පෝරමය (අර්ථලාභී අයිතිකරුවන් සඳහා)<br>• භාරකාර ඔප්පු | **යෝග්‍යතා නිර්නායක**<br>• වලංගු ජාතික හැඳුනුම්පතක්/රියදුරු බලපත්‍රයක්/වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18ට වැඩි ඕනෑම ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්.<br><br>• වලංගු ලියාපදිංචි ලියවිල්ලක් හිමි ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනයක් වීම.<br><br>• මුල් ගිණුම විවෘත කිරීමේ අවමය රු. 500කි.<br><br>• ගිණුම පවත්වා ගැනීමට අවශ්‍ය අවමය රු. 500කි.<br><br>• ඕනෑම මුදල් ආපසු ගැනීමක් රු. 100,000/-ක් වන තෙක් මුදල් වලින් සහ වෙනත් මුදල් ආපසු ගැනීම චෙක්පත් මගින් කළ යුතුය.<br><br>• සෙනසුරාදා දිනයන්හි කෙරෙන ඕනෑම ඉතිරි කිරීම් ආපසු ගැනීමක් පාරිභෝකයාගේ පූර්ව දැනුම් දීමක් මත පමණක් සිදුකෙරේ.<br><br>• උදාසීන ගිණුම් ප්‍රතිපත්තිය උදාසීන/අත්හරින ලද ස්ථාවර තැන්පතු ගිණුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුමත කරන ලද නීති ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| හැකියාව ඇත | | • අධ්‍යක්ෂවරුන්ගේ ජා.හැ.පත් වල පිටපත්<br><br>පදිංචි ලිපිනය ජා.හැ. පතෙන් හෝ රියදුරු බලපත්‍රයෙන් වෙනස් නම් සියළුම ගණුදෙනුකරුවන් ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br><br>උපයෝගිතා බිල්පත් සඳහා උදාහරණ - (විදුලි බිල්පත, ජල බිල්පත, ස්ථාවර දුරකථන බිල්පත)<br><br>තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි වෙනත් ලේඛණ - බැංකු ප්‍රකාශ, කුලී ගිවිසුම්, රාජ්‍ය අධිකාරියකින් ගත් ලිපි, රැකියා ගිවිසුම්. | අනුගමනය කරනු ලැබේ. කිසියම් ගිණුමක් අඛණ්ඩවම වසර 10කට හෝ ඊට වැඩි කාලයක් ගිණුම් හිමියාගෙන් කිසිඳු මූල්‍ය ක්‍රියාකාර කමක් (මුදල් ආපසු ගැනීමක් හෝ ඉතිරි කිරීමේ තැන්පතුවක් ) නොමැති නම්, එම ගිණුම ''අක්‍රිය ගිණුමක්'' සේ සලකනු ලබන අතර තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දන්වනු ලබයි.<br><br>• පාස්පොතක් නැතිවූ විටක, සතුටුදායක පැහැදිලි කිරීමක් සහ ගිණුම් හිමියාගෙන් ලබාගන්නා දිවුරුම් ප්‍රකාශයක් මත නව පාස්පොතක් නිකුත් කෙරේ. (සහතික කළ යුතු වන්නේ සාම විනිසුරු හෝ නීතීඥ)<br><br>• වෙනත් නියමයන් හා කොන්දේසි සඳහා ඉතිරි කිරීම් අයදුම්පතේ පිටපැත්ත බලන්න. |

**ප්‍රධාන තොරතුරු ලේඛණය - ඉතිරි කිරීමේ ගිණුම් (AFC හපන්නු)**

| ගිණුම් විස්තරය | AFC හපන්නු යනු විශේෂ ඉතුරුම් ක්‍රමයක් වන අතර එය සුළු ඉතුරුම් බලමුලු ගැන්වීම සහ පාසල් දරුවන්ගේ අනාගතය සුරැකීමට දිරිමත් කිරීම අරමුණු කරගෙන ඇත. | | |
|---|---|---|---|
| **සේවාදායකයන්ට ප්‍රතිලාභ** | **කුලී/ගාස්තු විස්තර** | **ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍යලියවිලි හා ක්‍රියාවලිය** | **ප්‍රධාන නියමයන් හා කොන්දේසි** |
| • පොළිය දිනපතා ශේෂයට ගණනය කරන අර එය මාසිකව ගිණුමට බැර කෙරෙනු ඇත.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති බැවින් එක් තැන්පත් කරුවෙකුට උපරිම රු. 1,100,000/- වන්දියක් ලබා ගැනීමේ හැකියාව ඇත | නවතම පොළී අනුපාත සඳහා AFC වෙබ් අඩවියට පිවිසෙන්න. www.alliancefinance.lk<br><br>ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ, වසාදැමීමේ ගාස්තු නැත. | **පුද්ගලික තැන්පතු සඳහා**<br>• නියමිත ආකාරයට පුරවා සම්පූර්ණ කළ ඉතිරි කිරීම් අයදුම්පත හා අත්සන් පත<br>• බාලවයස්කරුගේ උප්පැන්න සහතිකයෙහි පිටපතක්<br>• නියමිත ලෙස පුරවා සම්පූර්ණ කළ පාරිභෝගික ආකෘතිය (භාරකරු)<br>• භාරකරුගේ ජා.හැ.ප/රියදුරු බලපත්‍රය/විදේශ ගමන් බලපත්‍රය<br>• රැඳවුම් බදු ප්‍රකාශය (අදාළ නම්)<br>( පොලිය මත අයකරන බදු දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම චක්‍රලේඛය මත පදනම් වේ)<br><br>පදිංචි ලිපිනය ජා.හැ. පතෙන් හෝ රියදුරු බලපත්‍රයෙන් වෙනස් නම් සියළුම ගණුදෙනුකරුවන් ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br><br>උපයෝගිතා බිල්පත් සඳහා උදාහරණ - (විදුලි බිල්පත, ජල බිල්පත, ස්ථාවර දුරකථන බිල්පත)<br><br>තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි වෙනත් ලේඛණ - බැංකු ප්‍රකාශ, කුලී ගිවිසුම්, රාජ්‍ය අධිකාරියකින් ගත් ලිපි, රැකියා ගිවිසුම්. | **යෝග්‍යතා නිර්නායක**<br>• වයස අවුරුදු 18ට අඩු ඕනෑම ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්. දරුවා වෙනුවෙන් දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරු හට ගිණුම විවෘත කළ හැකි වේ.<br>• මුල් ගිණුම විවෘත කිරීමේ අවමය රු. 1000කි.<br>• බාලවයස්කරුට වයස අවුරුදු 18ක් සපිරෙන තුරු මුදල් ආපසු ගැනීම් කළ නොහැක.<br>• මුදල් ආපසු ගැනීමකට අවසර ඇත්තේ කළමණාකරුගේ අභිමතය පරිදි භාරකරු විසින් ඉදිරිපත් කරන ලද වලංගු ලියකියවිලි මත පදනම්ව, බාලවයස්කාර ගිණුම් හිමියෙකුගේ තීරණාත්මක අවශ්‍යතාවයන් වන අධ්‍යාපනය සහ වෛද්‍ය කටයුතු වැනිදා සඳහා පමණි.<br>• වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විට බාලවයස්කරුට ගිණුමේ මුදල් ආපසු ගැනීම හෝ ගිණුම සමාන්‍ය ඉතිරි කිරීම් ගිණුමකට මාරු කර ගැනීම හෝ කළ හැක.<br>• අක්‍රිය ගිණුම් ප්‍රතිපත්තිය<br>ගිණුම සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුමකට හැරවූ පසු අක්‍රිය ගිණුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ (වැඩිහිටි)<br>• පාස්පොතක් නැතිවූ විටක, සතුටුදායක පැහැදිලි කිරීමක් සහ දෙමාපිය/භාරකරුගෙන් ලබාගන්නා දිවුරුම් ප්‍රකාශයක් මත නව පාස්පොතක් නිකුත් කෙරේ.<br>(සහතික කළ යුතු වන්නේ සාම විනිසුරු හෝ නීතීඥ)<br>• වෙනත් නියමයන් හා කොන්දේසි සඳහා ඉතිරි කිරීම් අයදුම්පතේ පිටපැත්ත බලන්න. |

ප්‍රධාන තොරතුරු ලේඛණය - **ක්ෂණික** මූල්‍ය ණය

| | |
|---|---|
| ගිණුම් විස්තරය | මෙය විශේෂයෙන් නිර්මාණය කර ඇත්තේ ඔබට ඇති විය හැකි හදිසි මුදල් අවශ්‍යතා සඳහා **වන අතර** ඔබේ ස්ථාවර තැන්පතුවේ අගයෙන් 75%ක් දක්වා **ක්ෂණික** ණයක් **ස්ථාවර තැන්පතු පොලිය අඩු වීමකින් තොරව** ලබාගත **හැකිය.** ඔබේ ස්ථිර තැන්පතුව කල්පිරීමට පෙර **ලබාගත් ණය මුදල පහසු ආකාරයෙන්** ආපසු **ගෙවීමට හැකි අතර** ඔබේ **මූලික මුදල** පූර්ණව ලබාගැනීමේ අයිතිය ඔබට හිමිවේ. |

| සේවාදායකයන්ට ප්‍රතිලාභ | කුලී/ගාස්තු විස්තර | ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍යලියවිලි හා ක්‍රියාවලිය | ප්‍රධාන නියමයන් හා කොන්දේසි |
|---|---|---|---|
| • තැන්පත්කරුවන්ට තම ස්ථාවර තැන්පතු සහතික ඇපයට තැබීමෙන් හදිසි අවශ්‍යතාවන්ට මුදල් ණය ලබාගත හැක.<br>• ඔබේ ආයෝජනයෙන් 75% සිට 90% දක්වා අනුමත කිරීමක් මත<br>• ණය පොළිය දිනපතා ශේෂයට ගණනය කරන අර ඌණතා ශේෂ ක්‍රමය මත ආපසු අයකර ගනු ලැබේ.<br>• ඉතා පහසු ලේඛණගත කිරීම.<br>• නිවැරදි ලියවිලි සමග පැමිණෙන සේවාදායකයන් හට විනාඩි 45ක් තුළ ණය මුදල ලබාදිය හැක.<br>• ස්ථාවර තැන්පතු වල පොළිය ස්වයංක්‍රියවම ඔබේ **ක්ෂණික** මුදල් ණය පහසුකමට හැරවීමෙන් ණය පොලිය හා ප්‍රාග්ධනය හිලව් කෙරේ. | **ක්ෂණික මුදල් ණය අනුපාතය**<br><br>ණය පොලී අනුපාතය =ස්ථාවර තැන්පතු පොලී අනුපාතය + 4%<br><br>අවම ණය පොලී අනුපාතය කළමණාකාරීත්වයේ අභිමතය මත තීරණය වේ.<br><br>ණය මුදලේ ප්‍රමාණය රුපියල් මිලියන 1ට අඩු වූ විට ප්‍රලේඛන ගාස්තුව රු. 500කි. ණය මුදලේ ප්‍රමාණය රුපියල් මිලියන 1 හෝ ඊට වැඩි වූ විට ප්‍රලේඛන ගාස්තුව රු. 1000කි.<br><br>කළමණාකාරීත්වයේ අභිමතය මත සියළු ගාස්තු කළින් කළ වෙනස් විය හැකිය. | නියමිත ලෙස පිටසන් කළ මුල් ස්ථාවර තැන්පත් සහතිකය<br><br>සම්පූර්ණ කරන ලද ක්ෂණික ණය මුදල් අයදුම්පත් පෝරමය<br><br>පුරවන ලද සහ අත්සන් කළ නියමයන් හා කොන්දේසි ඉදිරිපත් කරන්න<br><br>ජා.හැ.ප/රියදුරු බලපත්‍රය/විදේශ ගමන් බලපත්‍රය<br><br>පදිංචි ලිපිනය ජා.හැ. පතෙන් හෝ රියදුරු බලපත්‍රයෙන් වෙනස් නම් ලිපිනය සත්‍යාපනය සඳහා ලේඛණ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.<br><br>ණය මුදල සම්පූර්ණයෙන් පියවනතුරු නම්කළ තැනැත්තා /තැනැත්තන් අවලංගු කිරීම. | **යෝග්‍යතා නිර්නායක**<br><br>බාලවයස්කාර ගිණුම් හිමියන් හැර සියළු AFCගිණුම් හිමියන් ''AFC ක්ෂණික ණය පහසුකමට'' සුදුසුකම් ලබයි.<br><br>ණය පොළිය තැන්පතු වල මාසික පොළී වලින් කල්පිරෙන දිනය දක්වා අයකරගනු ලබන අතර ගිණුම් හිමියන්ට ඔවුන්ගේ ණය පොළිය මාසික පොළී පදනම මත අදාළ නියමිත දිනට ගෙවිය යුතුය.<br><br>ස්ථාවර තැන්පතු කල්පිරීමෙන් පසුව වුවද ණය ශේෂය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඔබ අදහස් කරන්නේ නම්, ක්ෂණික ණය පහසුකම් ශේෂය ස්ථාවර තැන්පතුවේ නව පොළී අනුපාතය සමග නැවත දීර්ඝ කරන අතර ගෙවිය යුතු ණය පොළී අවශ්‍යතාවන් සම්පූර්ණයෙන් පියවීම්ට අවශ්‍ය වනු ඇත. |

ප්‍රධාන තොරතුරු ලේඛණය - **ක්ෂුද්‍ර ඉතුරුම් ගිණුම**

| ගිණුම් විස්තරය | AFC හපන්නු යනු විශේෂ ඉතුරුම් ක්‍රමයක් වන අතර එය සුළු ඉතුරුම් බලමුලු ගැන්වීම සහ පාසල් දරුවන්ගේ අනාගතය සුරැකීමට දිරිමත් කිරීම අරමුණු කරගෙන ඇත. | | |
|---|---|---|---|
| **සේවාදායකයන්ට ප්‍රතිලාභ** | **කුලී/ගාස්තු විස්තර** | **ගිණුමක් විවෘත කිරීම සඳහා අවශ්‍යාලියවිලි හා ක්‍රියාවලිය** | **ප්‍රධාන නියමයන් හා කොන්දේසි** |
| • පොලිය දිනපතා ශේෂයට ගණනය කරන අර එය මාසිකව ගිණුමට බැර කෙරෙනු ඇත.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති බැවින් එක් තැන්පත් කරුවෙකුට උපරිම රු. 1,100,000/- වන්දියක් ලබා ගැනීමේ හැකියාව ඇත.<br>• ක්ෂුද්‍ර ණය ගැනීම් සඳහා ඇපයක් ලෙස ක්‍රියා කරන්න<br>• ඉතිරි කිරීමේ ගිණුම තුළ සම්පූර්ණ ශේෂ අගය තිබේ නම් ක්ෂුද්‍ර ණය පියවීමට භාවිතා කළ හැක.<br>• අවම තැන්පතු වටිනාකමක් නැත. | ක්ෂුද්‍ර ඉතුරුම් ගිණුම් පොලී අනුපාතය 4%<br><br>ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යෑමේ, වසාදැමීමේ ගාස්තු නැත. | **පුද්ගලික තැන්පතු සඳහා**<br>• නියමිත ආකාරයට පුරවා සම්පූර්ණ කළ ක්ෂුද්‍ර ඉතුරුම් ගිණුම් අයදුම්පත<br>• ණය සඳහා සුදුසුකම් නිර්ණායක ගිණුම විවෘත කිරීමට අදාළ වේ | **යෝග්‍යතා නිර්නායක**<br>• ක්ෂුද්‍ර ණය ගැතියෙකු විය යුතුය.<br>• කාන්තාවන් සඳහා පමණක් ලබා දී ඇත.<br>• ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පතක් තිබිය යුතුය.<br>• නිෂ්පාදන ප්‍රතිපත්තියට අනුව අනිවාර්ය තැන්පතු සිදු කළ යුතුය.<br>• උදාසීන ගිණුම් ප්‍රතිපත්තිය<br>උදාසීන/අත්හරින ලද ස්ථාවර තැන්පතු ගිණුම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුමත කරන ලද නීති ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ. කිසියම් ගිණුමක් අඛණ්ඩවම වසර 10කට හෝ ඊට වැඩි කාලයක් ගිණුම් හිමියාගෙන් කිසිඳු මූල්‍ය ක්‍රියාකාර කමක් (මුදල් ආපසු ගැනීමක් හෝ ඉතිරි කිරීමේ තැන්පතුවක් ) නොමැති නම්, එම ගිණුම ''අක්‍රීය ගිණුමක්'' සේ සලකනු ලබන අතර තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දන්වනු ලබයි. |

# පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය

**පහත දැක්වෙන ක්‍රමවේද ඔස්සේ අපගේ සේවාවන් පිළිබඳව ඔබට පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.**

- අදාළ ශාඛාවේ ශාඛා කළමනාකරු වෙත ලිපියක් යොමු කිරීම.

  (සම්බන්ධතා විස්තර අපගේ වෙබ් අඩවියේ දක්වා ඇත - www.alliancefinance.lk)

- පාරිභෝගික සේවා කළමනාකරු වෙත යොමු කරන ලද ලිපියක් යොමු කිරීම - අංක 84 වෝඩ් පෙදෙස කොළඹ -7
- දුරකථන අංක 0771090122 හරහා හෝ පාරිභෝගික සේවා ඇමතුම් අංක 112673673 ඔස්සේ අපගේ පාරිභෝගික සේවා කළමනාකරු අමතන්න.
- ලිපියක් හෝ විද්‍යුත් තැපෑලක් info@alliancefinance.lk වෙත යොමු කිරීම.

සමාගම විසින් පැමිණිල්ල පිළිගෙන පැමිණිල්ල ස්වාධීනව සමාලෝචනය කළ යුතු අතර - තවද සමාගම විසින් පාරිභෝගිකයා සම්බන්ධ කර ගත යුතු අතර වැඩ කරන දින 7 ක කාලයක් තුළ ප්‍රතිඵල හෝ තීරණය පිළිබඳ විස්තර ලබා දිය යුතුයි.

සමාගම විසින් සතුටුදායක විසඳුමක් ලබා නොදුනහොත් පාරිභෝගිකයාට තම පැමිණිල්ල ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්

ලිපිනය - 143 වජිර පාර

කොළඹ -05

**දුරකථන අංකː +94112 595624 විද්‍යුත් තැපෑලː fosril@sltnet.lk**

**වෙබ් පිටුවː www.financialombudsman.lk**